# සංගීත කාව්‍ය සංකල්පය

**ජී. ඩබ්. ජයන්ත අරවින්ද**[1]

සංගීතය හා කාව්‍යය (music and poetry) යන දෙකලාවන් පිළිවෙලින් ස්වරය (musical note), හා වචනය (word) යන කලා මාධ්‍ය පදනම් කොට ගෙන පවත්නා ස්වාධීන කලාවන් දෙකක් වුවත් සංගීත ස්වරය හා වචනය එක් තැන් වීමෙන් කවි, ගීත වැනි සංගත (combined) කලා කෘති බිහි වේ.

එහෙත් කවියක් හෝ ගීතයක් වශයෙන් ස්වරය හා වචනය එක් තැන් වූ පමණින් කාව්‍යයක් බිහි නොවේ. කාව්‍ය කෘතියක් වීමට නම් කවි බස මාධ්‍ය කොට ගත් කාව්‍යෝක්තීන් නොහොත් කාව්‍යමය ප්‍රකාශන ගැබ් විය යුතුයි. මෙය විද්‍යාත්මක දෘෂ්ටිය හෝ හුදු වාර්තාගත ස්වරූපය ඉක්මවා, උපමා රූපක වැනි කාව්‍ය උපක්‍රම යොදා ගනිමින් භෞතික ලෝකය, මානව සමාජය, මිනිස් සිතුවිලි, හැඟීම් නිර්මාණාත්මක ලෙස සංඝටනය කොට ගොඩනගනු ලබන කලාත්මක ප්‍රකාශනයකි. ඉංග්‍රිසියෙන් 'poetry' පොයෙට්‍රි නම් වේ.

මෙබඳු කාව්‍ය කෘතියකට, එකකින් අනික උද්දීපනය කරන අන්දමේ ස්වර රචනයක් (melody) එක් වූ කල එය කාව්‍ය ගීතයක් (poetic song) නොහොත් ගීත කාව්‍යයක් (musical poem) වේ. සමහරු ගේය කාව්‍ය වශයෙන් ද හඳුන්වති. එය ගද්‍ය හෝ පද්‍ය කෘතියක් වන අතර ගීතයක් වීම සඳහා අවශ්‍ය පෘථුල ස්වර පරාශයක පිහිටයි.

මෙබඳු ගීත කාව්‍ය කෘති බෙහෙවින් අඩංගු වන්නේ සංගීතමය හා කාව්‍යමය ගුණයෙන් යුත් නාට්‍ය හෝ ගීත නාටක (opera) තුළය. සිංහබාහු, පේමතෝ ජායතී සෝකෝ වැනි සරච්චන්ද්‍ර නාට්‍ය හා ගීත නාටකවල මෙබඳු කාව්‍ය හා සංගීතය සුසංගත වූ අවස්ථා බහුල වශයෙන් දක්නට ඇත. ගීත කාව්‍ය නිර්මාතෘන් එම කලාවන් කෙරේ දක්වන සුසංවේදීභාවය හා නිර්මාණ ප්‍රතිභාව සාර්ථක ගීත කාව්‍ය නිර්මාණයට හේතු වේ.

---

[1] අවාස පාර, කැස්බෑව, පිලියන්දල
"පේමතෝ ජායතී සෝකෝ" නාට්‍යයේ සංගීත අධ්‍යක්ෂ

කාව්‍යයත් සංගීතයත් සුසංගත වෙමින් ගොඩ නැගෙන මෙබඳු ගීත කාව්‍යවල ඇතුළත් කාව්‍ය සංගීත ලක්ෂණ හා ඒවා අන්‍යොන්‍ය වශයෙන් එකිනෙක උද්දීපනය වන ආකාරය ශාස්ත්‍රීය නිර්ණායක ඔස්සේ විමසා බැලීම සෞන්දර්ය කලා විෂයට අයත් රසවත් අධ්‍යයන කාර්යයකි. එහෙත්, මෙසේ ගීත කාව්‍ය කෘතියක් කාව්‍යමය හා සංගීතමය දෘෂ්ටිකෝණවලින් ශාස්ත්‍රීය විචාරයට භාජනය වන අවස්ථා දුර්ලභ ය. බොහෝ විට සිදු වන්නේ එබඳු කෘතියක භාෂා සාහිත්‍ය ලක්ෂණ පිළිබද විමසීමක් පමණි. මීට ප්‍රධාන හේතුව ගීත කාව්‍ය කෘති සුවිශේෂ වශයෙන් හඳුනා ගෙන ඒවා ඇගැයීම සඳහා තෝරා නො ගැනීමත් කාව්‍ය දෙකලාවන් (lyrics and melody) පිළිබද දැනුම් කුසලතා වර්ධනය කොට ගත් විචාරක හා රසික පිරිසකගේ දුර්වලත්වයත් ය.

මෙම පර්යේෂණ ලිපියේ අරමුණ ශ්‍රාවකයා එබඳු විචාර අධ්‍යයනයකට යොමු කිරීමය.

**ප්‍රමුඛ පදඃ** සංගීතය හා කාව්‍යය, සංගත කලා, ස්වර රචනය, ගීත කාව්‍යය, ගීත නාටක

**Title:** Concept of Musical Poem

**Keywords:** music and poetry, combined arts, melody, opera